කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී වසර අවසාන පරීක්ෂණය සිව්වන වසර - පළමු
සෙමෙස්තරය 2019/20
HIS 4175 ඓතිහාසික ලේඛන
කාලය පැ (02) දෙකයි.

ප්‍රශ්න (03) තුනකට පමණක් පිළිතුරු සපයන්න

---

1. විවරණය කරන්න

3. මේ වංශතෙම පුරාතනයන් විසින් කරණ ලද්දේ නමුත් කිසි තැනෙක්ම ඉතා විස්තර කරණ ලද්දේය. කිසි තැනෙක් හි මෙය අතිශයෙන් සංක්ෂිප්ත ය. නොයෙක් පුනරුක්ත දෝෂ ඇත්තේ ය. ඒ දොසින් තොර කරණ ලද්දා වූ (හෙයින්ම) සුවසේ ග්‍රහධාරණ කට හැකි වූ ප්‍රසාදසංවේග ජනක වූ
4 පරම්පරායාත වූ ද ඒ මහාවංශය (කථනය කරන්නෙමි සජ්ජනයෙනි තෙපි) ප්‍රසාද උපදවන්නා වූ තන්හි එසේම සංවේග ජනක තන්හිද පහන් සිත් හා භය කම්පා උපදවමින් ශ්‍රවණය කරව්. (මහාවංශය, පි 01)

2. නායිම්මන පරාක්‍රමබාහුගේ දෙමල සෙල්ලිපිය ආශ්‍රිත කොට ගෙන අභිලේඛනයක් මූලාශ්‍ර ලෙස භාවිතයේ දී මතු විය හැකි ගැටලු මොනවාදැයි සාකච්ඡා කරන්න.

3. වල්ලිපුරම් රන් සන්නස ජන වාර්ගික ගැටුමක් පවතින යුගයකදී වාර්ගික හිමිකම් කියාපෑම සනාථ කරන ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස ඉතිහාසකරණයේ දී යොදා ගන්නා ආකාරය විවේචනාත්මකව සාකච්ඡා කරන්න .

4. ලංකාවේ ජන සංක්‍රමණ පිළිබඳ ඉතිහාකරණය සඳහා 'වන්නි සාහිත්‍යය' මූලාශ්‍රයක් ලෙස වැදගත් වන්නේ ද යන්න විමසන්න.

5. අනගාරික ධර්මපාලගේ 'ගිහි දින චරියාව' ලේඛනය 20 වන සියවසෙහි සිංහල බෞද්ධ දෘෂ්ටිවාදය තැනීමෙහිලා කල බලපෑම තක්සේරු කරන්න .

6. විවරණය කරන්න

රටේ ජනගහනය සජාතීය නොවන්නාක් මෙන් ම එයට ඇතුළු වන විවිධ ජන කොටස් කොටස් එකිනෙකා කෙරෙහි සැක සහිතව පමණක් නොව අවිශ්වාසයෙන් ද වෙසෙති. ලංකාවේ ස්වදේශානුරාගය යන්න විග්‍රහ කෙරෙන්නේ ජාතික වශයෙන් පමණක් නොව වර්ග වශයෙන් ද වෙයි. සමහර විට රටේ පොදු යහපත යනුවෙන් හැඳින්වෙන්නේ එක් ජන කොටසකගේ යහපත ය. සම්පූර්ණ වගකීම් සහිත ආණ්ඩුවක් සඳහා කෙරෙන ඉල්ලීම මේ අන්දමින් විග්‍රහ කළ විට, මේ ඉල්ලීම ඉදිරිපත් කරන අය රටේ වැඩි සංඛ්‍යාවක් ඇති ජන කොටස්වලට අයත් අය බවත්, ඔවුන් පාලන බැම්වලින් මුදාහැරි විට ඔවුන්ට විරුද්ධ

අය කෙරෙහි ඔවුන් ගේ මතය පැටවීමට හැකි වන බවත් පෙනේ. සුළු ජනකොටස්වලට අයත් අය අතර වෙන කිසිම කරුණක් ගැන එකමුතුකමක් නැති වුවත්, මේ යෝජනාවට ඔවුහු එක හඬින් විරුද්ධ වෙති. (ඩොනමෝර් කොමිෂන් සභා වාර්තාව, සිංහල පරිවර්තනය පි 38)